Page 1 Julu 2010.qxd 22/07/2010 17:00 Page 1


# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය !
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 04

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JULY 10, 2010 ජූලි මාසය (බුද්ධ වර්ෂ 2554 ඇසළ මාසය)

http://www.lankaheritage.com/lankaviththi/




## World Cup Football 2010

A student who escaped from **North Korea** watches a live broadcast of the **2010 World Cup Group G** soccer match between **North Korea** and **Portugal** in **Cape Town** on June 21, 2010, at the Hangyeore high school for North Korean teenage defectors. This school is situated in Anseong, about 80 km south of **Seoul, South Korea.** About 100 students of the school gathered at its gymnasium and cheered for their former nation's soccer team. (REUTERS)

## හිටපු රටට ජයවේවා !

දේශපාලන හේතූන් මත උතුරු කොරියාවේ සිට දකුණු කොරියාවට පැන ඇවිත් සිටින පිරිස් වල ළමයින් සඳහා වෙනම පාසැලක් දකුණු කොරියාවේ සියොල් නගරයේ ඇත. දකුණු අප්‍රිකාවේ පැවති පාපන්දු ලෝක කුසලාන තරඟවල දී පෘතුගාලයට එරෙහිව උතුරු කොරියාව පිටියට වන් විට ඒ තරඟය නරඹන්නට උතුරු කොරියාවෙන් ආ ළමයින්ට එම පාසැලේ රූපවාහිනියක් ලබා දෙන ලදී. මේ යුවතිය ඇතුළු ශිෂ්‍යාවන් එදා තමන් අතැර ආ මව් රටට අද ජය පතමින් විමසිල්ලෙන් තරඟය නැරඹූ සැටිය මේ.

අතැර දමා පැන ආවත් උපන් රට
නිතර නැතත් සිහිවෙයි එය විටින් විට
සතුරු නොවී උන්හට ජය පතන් නට
මිතුර බැරිද? මා වැරදිද? කියන් මට

**Though I angrily fled the country I was born**
**Here in safety haven I think of it off and on**
**I anticipate their victory, my enmity is gone**
**It may sound odd, but tell me if I am wrong !**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

# මොනවද මේ වෙන්නෙ.....?

♦ **සංජය විමලරත්න විසිනි**

**යු**ද්ධයෙන් ත්‍රස්තවාදය ශ්‍රීලංකාවෙන් මුලිනුපුටා දමා දැන් වසරක්ද ඉක්ම ගොස් ඇත. කවුරුත් අපේක්ෂා කළ ආකාරයට රටේ දේශපාලන සහ අනෙක් අංශවලින් යම් ඉදිරි ගමනක් ගොස් ඇත. මේවා සමහරක් ගතයුතුව තිබුණු පියවරවල් වූහ. එහෙත් මෑතක සිදුවෙමින් පවතින සමහර දේවල් ගැන විමසිල්ලෙන් බලන විට ඉහත ශීර්ෂ පාඨයේ අසා ඇති ප්‍රශ්නය දැනුවත්ව හෝ නොදැනු වත්ව හෝ සිතේ මතු වේ. එවැනි කරුණු කීපයක් ගැන පාඨක අවධානය යොමුකිරීම අද මෙම ලිපියෙන් අපේ අරමුණයි.

### බැංකි මූන් මේ අඳින්නේ මොකාටද?

යුද්ධය අවසන් වී වැඩිකල් නොගොස්ම ලොවේ විවිධ තැන්වල විසිරී සිටින කොටි ව්‍යාපාරයේ හිතවතුන් සහ අප රටට සතුරු ස්ථාවරවල පිහිටි සමහර සංවිධානත් බටහිර රටවලුත් එන් ජී ඕ සංවිධාන ආදියත් යුද්ධයේ අවසන් අවස්ථාව තුළදී ලංකා රජයේ සන්නද්ධ හමුදා අන්තර් ජාතික මානව අයිතිවාසිකම් උල්ලංඝණය කරමින් කටයුතු කළේය යන අසත්‍ය අවලාදයන් නගමින් චෝදනා නැගූහ. මේවා සියල්ලම වාගේ අපට සතුරු, කොටි ත්‍රස්තවාදීන්ට හිතවත් විවිධ කණ්ඩායම්, සංවිධාන ආදිය මතු කළ චෝදනාය. මෙහිදී අප රට ඉතා නිවැරදි ස්ථාවරයක් ගනිමින් මේවා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළාය.

### බැංකි මූන්ගේ ත්‍රි පුද්ගල කමිටුව

ලංකාවේ මානව අයිතිවාසිකම් වලට අදාළ කරුණු විමසීම් අරභයා ත්‍රි පුද්ගල උපදේශක කමිටුවක් එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන් කි මූන් විසින් සති කීපයකට පෙර පත් කරන ලදී. යුද්ධය අවසන් වනු සමගම අප සතුරන් ඉහත සඳහන් චෝදනාව දිගින් දිගටම ගෙන ආ නමුදු එකද වගකිව යුතු අන්තර් ජාතික සංවිධානයක් හෝ රටක් හෝ විසින් එවැනි විභාග කිරීමක් සඳහා කමිටු පත් කළ යුතු යයි එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉල්ලීමක් නොකරන ලදී. මෙම කමිටුව පත්කිරීමට බැංකි මූන්ට අර එන්පීඕ කාරයිනුත් මානව අයිතිවාසිකම් සඳහා යයි කියමින් සිටිනා **Human Right Watch** වැනි සංවිධානත්, බ්‍රිතාන්‍යය යුරෝපා සමූළුවේ සමහර රටවල් සහ ඇමරිකාවේ සමහරුන්ගේත් කෙලින් ඉදිරිපත් නොවී වක්‍ර ලෙස හැංගි හොරා කරන ලද බලපෑම්වල ප්‍රතිඵලයක් වශයෙන් බව පැහැදිලිය. මෙම ත්‍රිපුද්ගල කමිටුව සමන්විත වනුයේ හිටපු ඉන්දුනීසියානු ඇටර්නි ජනරාල් වරයෙකු වූ මර්සුකි දරුස්මාන් (සභාපති), දකුණු අප්‍රිකාවේ සත්‍යගවේෂණය සහ සම්මුති **(Truth & reconciliation)**කොමිසමේ කටයුතු කළ යැස්මින් සූසා සහ ඇමරිකානු නීතිඥ වරයෙකු වූ ස්ටීවන් රැට්නර් ද වෙති.

මෙම කමිටුව පත්කරනු ලැබූයේ තිබුණු චෝදනා රාශිය පිළිබඳ විභාග කිරීමට ලංකාව විසින් මහත් වගකීම කින් යුතුව පත්කරනු ලැබූ විශේෂඥ කමිටුවක් ක්‍රියාත්මකව තිබෙන අතරතුරේදීය. ලංකාව නිවැරදි ස්ථාවරයක් ගනිමින් බැංකි මූන්ගේ මේ උපදේශක කමිටුව ප්‍රතික්ෂේප කරමින් ඔවුන්ට රට තුළට ඒමට වීසා ද තහනම් කොට ඇත.

### බළලා මල්ලෙන් එළියට පනී

මෙම කමිටුව පත් කළ වහාම තම සංවිධානය එයට සාක්ෂිදීමට ඉදිරිපත් වන බව ප්‍රකාශ කළේ තම සංවිධානය ලෝකයේම ද්‍රවිඩ සංවිධාන නියෝජනය කරනවා යයි කියාගන්නා, කාලයක් කොටි සංවිධානයට හිතවත්ව කටයුතු කර ඇති රුද්‍රා රාජරත්නම් යන පුද්ගලයාය. යුද්ධය ගැන ඔවුන්ගෙන් සාක්ෂි ඇසීම හොරාගෙ අම්මාගෙන් පේන ඇසීමක් වැනිය. මේ උපදේශක කමිටුව පත්කිරීමට කටයුතු කළ බලවේග මොනවාදැයි මින් පැහැදිලිය. ඉදිරියට තව තවත් බලවේග හඳුනාගත හැකිවනු ඇත.

### ප්‍රතික්ෂේප කිරීම් -ප්‍රශ්නකිරීම්

චීනය සහ රුසියාව මේ වනවිටද බැංකිමූන් විසින් මේ කමිටුව පත්කරනු ලැබීම හෙළාදැක ඇත. ඔවුන් කියන්නේ ලංකාවට සිය රටේ ප්‍රශ්න විසඳාගැනීමට ඉඩනොදී මෙවැනි ඇඟිලිගැසීම් පිළිගත නොහැකි බවය. ලෝකයේ ජාතීන් විශාල සංඛ්‍යාවක් නියෝජනය කරන එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළත ඇති ප්‍රබලම කණ්ඩායමක් වන නොබැඳි ජාතීන්ගේ

4 වන පිටුව බලන්න ➛




ඔබේ මුදල් අදම යවන්න
අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3